# අයදුම්පත් කැඳවීම

**සී/ස ගාල්ල දිස්ත්‍රික් ස.ණ.ස සමිති සංගමයේ පුරප්පාඩුව පවතින පහත තනතුරු සඳහා 02/2022 දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ චක්‍රලේඛනය අනුව අයදුම්පත් කැඳවනු ලැබේ.**

## 1. සාමාන්‍යාධිකාරී තනතුර

**කේත අංකය EL 01 (iii ශ්‍රේණිය)**

**වැටුප් පරිමාණය. 29,500 - 900X5 -1,000X5 - 1,100.10 - 1,200X10 - 1,300X12 - 77600**

සමුපකාර සේවක කොමිෂන් සභාව 01/2022 චක්‍රලේඛනය අනුව අනුමත ජීවන අංක දීමනාව රු. 2,500 හා රු.7,500.00 ණයක දීමනාව සහ සංගමයේ ගරු අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කර ඇති වෙනත් දීමනා ද ගෙවනු ලැබේ.

තවද, හදිසි අනතුරු රක්ෂණාවරණයක්, තිල ඇඳුම් දීමනා, සේවක අර්ථසාධක අරමුදලට, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට සහ සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක කරනු ලැබේ.

වයස් සීමාව : අවුරුදු 18 ත් 45 ත් අතර විය යුතුය ( සමුපකාර සේවයේ නියුතු අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

- සුදුසුකම් : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වාණිජ්‍ය, කළමනාකරණ, ගණකාධිකරණ, ආර්ථික විද්‍යාව යන ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම සහ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර 05 කට නොඅඩු පළපුරුද්ද /පුහුණුව ලබා තිබීම

**හෝ**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම උපාධියක් ලබා තිබීම සහ පිළිගත් ආයතනයක ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ වසර 01 කට නොඅඩු ඩිප්ලෝමා සහතිකයක් ලබාතිබීම සහ පිළිගත් ආයතනයක විධායක තනතුරක වසර 05 කට නොඅඩු පළපුරුද්ද / පුහුණුව ලබා තිබීම

**හෝ**

- සමුපකාර සේවයේ EL02 මට්ටමේ ශ්‍රේණියේ තනතුරක සේවය කිරීම හෝ EL 02 මට්ටමේ 11 ශ්‍රේණියේ තනතුරක වසර 04 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

ලිපි කවරයේ වම්පස ඉහළ **"සාමාන්‍යාධිකාරී තනතුර"** යන්න සඳහන් කළ යුතුය.

## 2. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නිෂ්පාදන/ මානව සම්පත් / පරිපාලන/ සංවර්ධන) තනතුර

**කේත අංකය EL 02 (iii ශ්‍රේණිය)**

**වැටුප් පරිමාණය 26,000 - 760X5 -840X5- 920X10 -1,000X10 - 1,080X12 - 66,160**

සමුපකාර සේවක කොමිෂන් සභාව 01/2022 චක්‍රලේඛනය අනුව අනුමත ජීවන අංක දීමනාව රු 2500.00 හා රු. 7,500.00 ක දීමනාව සහ සංගමයේ ගරු අධ්‍යක්ෂක මණ්ඩලය විසින් හදිසි අනතුරු රක්ෂණාවරණයක්, තිල ඇඳුම්, සේවක අර්ථසාධක අරමුදලට සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට සහ සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක කරනු ලැබේ.

වයස් සීමාව : අවුරුදු 18 ත් 45 ත් අතර විය යුතුය. (සමුපකාර සේවයේ නියුතු අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

- සුදුසුකම් : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වාණිජ්‍ය කළමනාකරණ, ගණකාධිකරණ, ආර්ථික විද්‍යා යන ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම සහ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ වසර 05 කට නොඅඩු පළපුරුද්ද / පුහුණුව ලබා තිබීම.

**හෝ**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම උපාධියක් ලබාතිබීම සහ රජයේ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයට අදාළ වරස 01 කට නොඅඩු ඩිප්ලෝමාවක් ලබා තිබීම සහ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ වරස 05 කට නොඅඩු පළපුරුද්ද/ පුහුණුව ලබා තිබීම.

**හෝ**

- සමුපකාර සේවයේ EL 03 මට්ටමේ, ශ්‍රේණියේ තනතුරක සේවය කිරීම හෝ EL 03 මට්ටමේ, ශ්‍රේණියේ තනතුරක වසර 04 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

ලිපි කවරයේ වම්පස ඉහළ, **"නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුර සඳහා"** යන්න සඳහන් කළ යුතුයි.

ඉහත තනතුරු සඳහා සමුපකාර සමිතියක සේවය කරන අයෙකු අදාළ සමිතිය මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. වෙනත් සතියක සේවය කරන අතරතුර සෘජුව අයදුම්පත් එවා ඇති බව ඔහු/ ඇය තෝරාගත් පසුව වුව ද අනාවරණය වුවහොත් තනතුර අහිමි වීමට එය හේතුවක් වේ.

තමා විසින්ම පිළියෙල කරගත් අයදුම්පතක් සමග සනාථ කිරීමේ අධ්‍යාපන, වෘත්තීය, සහතිකවල පිටපත් උප්පැන්න සහතිකයේ හා හැඳුනුම්පතේ ඡායා පිටපතක් සමග පහත සඳහන් දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනය - 2024.10.15 දින ප.ව. 12.00 ට පෙර**

**අයදුම්පත් එවිය යුතු ලිපිනය**

**ගරු සභාපති,**
**සී/ස ගාල්ල දිස්ත්‍රික් සණස සමිති සංගමය,**
**තක්සලා "153" අබ්දුල් වහබ් මාවත, ගාල්ල.**

**මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ.**